Australian Government
Department of Home Affairs

# ගුවන් යානාවකින් ඕස්ට්‍රේලියාවෙන් පිටවීම

ඔබ ගුවන් යානාවකින් ඕස්ට්‍රේලියාවෙන් පිටවීමට සූදානම් වන විට පහත පියවර අනුගමන කරන්න.

## 1 වෙනි පියවර - ඔබේ සංචාරය සැලසුම් කිරීම

### ඉදිරියට සැලසුම් කරන්න

ඕස්ට්‍රේලියාවෙන් පිටවන සංචාරකයින්ට COVID-19 ට එරෙහිව සම්පූර්ණයෙන්ම එන්නත්කරණයට ලක් වී එන්නත්කරණයට ලක් වූ බවට සාධක හා අදාළ ලේඛණ අතැතිව ගමන් කරන ලෙස ඕස්ට්‍රේලියානු රජය යෝජනා කරයි.

ඔබේ ගමනේදී ප්‍රමාදය හෝ බාධාව ඇති වූ විට කුමක් සිදු කරන්නේද යන්න සලකා බැලිය යුතුය.

ඔබ සංක්‍රමණය වන සහ සංචාරය කරන සියලුම රටවල් සඳහා වත්මන් සංචාර, වීසා සහ COVID-19 උපදෙස් පරීක්ෂා කරන්න. සෑම රටකම ඇතුළත් වීම සඳහා විවිධ අවශ්‍යතා ඇත, එයට COVID-19 එන්නත් ලබා ගැනීම හා පරීක්ෂණ ද ඇතුළත් වෙයි.

ගුවන් සමාගම්වලට ද ඔබ සපුරාලිය යුතු නිශ්චිත අවශ්‍යතා තිබිය හැකිය.

අදාළ නම්, ඔබට ඕස්ට්‍රේලියාවට නැවත ඇතුළු වීමට කළ යුතු දේ බලන්න.

## 2 වෙනි පියවර -ඔබගේ ගමන් විකල්ප පරීක්ෂා කරන්න

ඕස්ට්‍රේලියාව පුරා ඇති ප්‍රධාන ගුවන් තොටුපළවලින් වාණිජ ගුවන් ගමන් තිබේ.

## 3 වෙනි පියවර - ඔබේ සංචාරය වෙන් කරවා ගැනීම

## 4 වෙනි පියවර - සංචාරයට සූදානම් වීම

ඔබ ගුවන්යානයට ඇතුළු වන විට, ගුවන් සේවකයින් විසින් ඔබෙන්:

- විදේශ ගමන් බලපත්‍රය
- ඇතුළු වීමේ අවසර පත්‍රය ඉල්ලා සිටිනු ලැබේ.

ජ්‍යාත්‍යන්තර සංචාර සඳහා පූර්ණ එන්නත්කරණයට ලක් වූ බවට ඕස්ට්‍රේලියාවේ නිර්වචනය සපුරාලන පරිදි සාක්ෂි සපයන ලෙස ඔබෙන් ඉල්ලා සිටීමට ඉඩ ඇත.

## 5 වෙනි පියවර - ඔබ විදේශයක සිටින විට

## යාවත්කාලීනව සිටින්න

ඔබට නැවත ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමට අවශ්‍ය නම්, ඔබ ඕස්ට්‍රේලියාවට ඇතුළු වීමේ අවශ්‍යතා නිතිපතා පරීක්ෂා කළ යුතුය. ඔබ සංචාර කරන අතරතුර ඒවා වෙනස් වීමට ඉඩ ඇත.